කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **07** WW/O/23/06/11/01

වර්ණය : ඇම්බර්


## නැගෙනහිර-මධ්‍යම අරාබි මුහුදු ප්‍රදේශයේ පවතින අතිශය චණ්ඩ “බිපොර්ජෝයි” සුළිකුණාටුව පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2023 ජූනි මස 12 දින ප.ව. 05.30 තෙක් වලංගු වන පරිදි,
2023 ජූනි මස 11 දින ප.ව. 05.30ට නිකුත් කරන ලදී.

### අරාබි මුහුදේ ගැඹුරු මුහුදු ප්‍රදේශවල යාත්‍රා කරන බහු-දින ධීවර යාත්‍රා සඳහා.

### සැලකිලිමත් වන්න!

**නැගෙනහිර-මධ්‍යම අරාබි මුහුදු ප්‍රදේශයේ පැවති "බිපොර්ජෝයි” ඉතා චණ්ඩ සුළිකුණාටුව, අතිශය චණ්ඩ සුළිකුණාටුවක් දක්වා වර්ධනය වී ඇත. 2023-06-11 දින පැය 1130 වනවිට උතුරු අක්ෂාංශ 18.2ත් නැගෙනහිර දේශාංශ 67.7ත් ආශ්‍රිතව ස්ථානගතව පැවතුනි. එය ඉදිරි පැය 24 තුළ ආසන්නව උතුරු දෙසට ගමන් කරනු ඇත.**




**Expected path of the cyclone (Source: RSMC-India)**

ඉදිරි පැය 24 තුල මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් උතුරු අක්ෂාංශ 13 ත් 23 ත් සහ නැගෙනහිර දේශාංශ 62 සහ 70 ත් අතර මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (155-165) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (170-180) පමණ දක්වා වැඩිවිය හැක.


ඉහත කී මුහුදු ප්‍රදේශ දළ රළු වන අතර විටින් විට ඉතා දළ රළු වේ. එසේම, තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**පද්ධතියේ පුරෝකථන මාර්ගය සහ පද්ධතියේ තීව්‍රතාවය**

| දිනය/වේලාව) (ශ්‍රී ලංකා පැය) | ස්ථානය (උතුරු අක්ෂාංශ °N නැගෙනහිර දේශාංශ °E) | උපරිම සුළගේ වේගය (පැයට කි. මී.) | කැළඹිලි ස්වභාවය |
|---|---|---|---|
| 11.06.23/1730 | 18.5/67.8 | 160-170 විටින් විට 190 දක්වා | අතිශය චණ්ඩ සුළි කුණාටුවක් |
| 11.06.23/2330 | 18.8/67.8 | 155-165 විටින් විට 185 දක්වා | ඉතා චණ්ඩ සුළි කුණාටුවක් |
| 12.06.23/0530 | 19.1/67.7 | 155-165 විටින් විට 185 දක්වා | ඉතා චණ්ඩ සුළි කුණාටුවක් |
| 12.06.23/1130 | 19.4/67.6 | 150-160 විටින් විට 180 දක්වා | ඉතා චණ්ඩ සුළි කුණාටුවක් |
| 12.06.23/2330 | 20.1/67.4 | 145-155 විටින් විට 175 දක්වා | ඉතා චණ්ඩ සුළි කුණාටුවක් |
| 13.06.23/1130 | 20.8/67.3 | 140-150 විටින් විට 165 දක්වා | ඉතා චණ්ඩ සුළි කුණාටුවක් |




## අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- උතුරු අක්ෂාංශ 13 - 23 ත් අතර සහ නැගෙනහිර දේශාංශ 62 - 70 ත් අතර මුහුදු ප්‍රදේශයට නැවත දැනුම් දෙන තුරු යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.
- දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **07** WW/O/23/06/11/01
COLOR: **Amber**


# Advisory for Extremely Severe Cyclonic Storm “Biparjoy” over East-Central Arabian Sea

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 05.30 p.m. 11 June 2023. Valid until 05.30 p.m. 12 June 2023

## For Multi-day boats in the Deep Arabian Sea

## PLEASE BE AWARE!

The very severe cyclonic storm “BIPARJOY” (pronounced as “BIPORJOY”) over East-Central Arabian Sea has intensified in to an extremely severe cyclonic storm. It was located near latitude 18.2°N and longitude 67.7°E at 1130 hours of 11th June, 2023. It would move nearly northwards during next 24 hours.




**Expected path of the cyclone (Source: RSMC India)**

Wind speed will be (155-165) kmph and can increase up to (170-180) kmph in sea areas bounded by (13N - 23N) and (62E – 70E) during next 24 hours due to this system.


Heavy showers or thundershowers; High, very high at times seas can also be expected in above sea areas.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**The forecast track and intensity of the system are given in the following table:**

| Date/Time (SLST) (Hrs) | Position (Lat. °N/ Long. °E) | Maximum wind speed (Kmph) | Category of cyclonic disturbance |
|---|---|---|---|
| 11.06.23/1730 | 18.5/67.8 | 160-170 gusting to 190 | Extremely Severe Cyclonic Storm |
| 11.06.23/2330 | 18.8/67.8 | 155-165 gusting to 185 | Very Severe Cyclonic Storm |
| 12.06.23/0530 | 19.1/67.7 | 155-165 gusting to 185 | Very Severe Cyclonic Storm |
| 12.06.23/1130 | 19.4/67.6 | 150-160 gusting to 180 | Very Severe Cyclonic Storm |
| 12.06.23/2330 | 20.1/67.4 | 145-155 gusting to 175 | Very Severe Cyclonic Storm |
| 13.06.23/1130 | 20.8/67.3 | 140-150 gusting to 165 | Very Severe Cyclonic Storm |




## Actions Required:

- **Naval and fishing communities are advised not to venture into the sea areas bounded by (13N - 23N) and between (62E – 70E) until further notice.**
- **Those who are out at aforementioned sea regions are advised to return to coasts or moved safer areas immediately.**
- **Fishing and naval community are requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**